# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

7 ශ්‍රේණිය

## ඉතිහාසය

නම/ විභාග අංකය: ........................................ කාලය ;- පැය 2 යි

### *I* – කොටස

**සැලකිය යුතුයි ඃ-**

- **ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- ***I* කොටසේ 1 - 20 දක්වා ප්‍රශ්න සියල්ලට ම නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(1) පැරණි සමාජයේ ජනතාවට මුහුණ දීමට සිදු වූ ප්‍රධාන අභියෝගයක් වූයේ,

(i) සතුරන්ගෙන් රට ආරක්ෂා කර ගැනීමයි.
(ii) යැපීම සඳහා ආහාර නිෂ්පාදනය කර ගැනීමයි.
(iii) භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමයි.
(iv) වගාබිම් සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීමයි.

(2) අකලහස, මදහස, පිට දඩ හස යනුවෙන් වී වගා කළ කන්න තුනක් පිලිබඳ ව දැක්වෙන්නේ,

(i) මහාවංසයේ ය
(ii) තෝනිගල සෙල් ලිපියේ ය
(iii) උම්මග්ග ජාතකයේ ය
(iv) සීහළවත්ථු ග්‍රන්ථයේ ය

(3) අතීතයේ දී කිරිගෙරි යනුවෙන් හැඳින්වූයේ,

(i) කිරි ලබා ගැනීම පිණිස ඇති කළ ගව දෙනුන් ය
(ii) කිරිවලින් සකස් කළ ආහාරවලට ය
(iii) පස් ගෝ රසවලට ය
(iv) මුදවන ලද මී කිරිවලට ය

(4) දියණියන් සූප ශාස්ත්‍රයෙන් දක්ෂයන් කිරීම දෙමාපියන් සතු වගකීමක් බව දැක්වෙන්නේ,

(i) මහා වංශයෙහි
(ii) සද්ධර්මලංකාරයෙහි
(iii) සහස්සවත්ථුපකරණයේ
(iv) සමන්තපාසාදිකාවේ

(5) අනුරාධපුර යුගයේ රට තුළ හොඳ නීති පද්ධතියක් ක්‍රියාත්මක ව පැවති බවට සාක්ෂියකි,

(i) ලබුගල සෙල්ලිපිය
(ii) බදුලු ටැම්ලිපිය
(iii) වේවැල්කැටිය සෙල්ලිපිය
(iv) මිහින්තලේ පවුරු ලිපිය

(6) අතීතයේ සෙල්ලිපිවල 'පිටබිම්' යනුවෙන් හඳුන්වා ඇත්තේ,

(i) ගොවිබිම් (ii) හේන් ය (iii) කුඹුරු ය (iv) පිටස්තර බිම් ය

(7) අතීතයේ දී ශ්‍රී ලංකාවේ පේෂ කර්මාන්තයේ නියැලුණු ශිල්පීන් හඳුන්වා ඇත්තේ කුමන් නමකින් ද?

(i) කුඹල්ලු (ii) මණිකර (iii) පෙහෙකාර (iv) තඹකර

(8) ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාමේ දී වැදගත් වූ ස්වභාවික පැරණි වරායක් වූයේ කුමක් ද?

(i) ගෝකණ්ණ (ii) කොළොම්තොට (iii) ගාල්ල (iv) මාගම

(9) පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කිරීමට දක්ෂ සෙන්පතියෙකු වූ කුට්ඨක සෙනෙවියාගේ ප්‍රධානත්වයෙන් යුත් බලවත් හමුදාවක් යැවූ රජතුමා වන්නේ,

(i) *I* වන සේන රජු ය

(ii) *II* වන සේන රජු ය

(iii) මානවම්ම රජු ය

(iv) දාඨෝපතිස්ස රජු ය

(10) නිශ්ශංකමල්ල රජතුමා ජනතා විශ්වාසය දිනා ගනිමින් කටයුතු කර ඇති බව තහවුරු කිරීමට උපයෝගී කර ගත හැකි සෙල්ලිපියක් නොවන්නේ පහත කුමක් ද?

(i) දෙවනගල සෙල්ලිපිය

(ii) ගල්පොත ශිලා ලිපිය

(iii) හැටදාගෙය ශිලා ලිපිය

(iv) දඹුලු පර්වත ලිපිය

(11) පරාක්‍රමබාහු කුමාරයාගේ උත්පත්තිය සිදු වූ ස්ථානයේ තනවා ඇති චෛත්‍ය පහත පිළිතුරු අතරින් කුමක් ද?

(i) කිරි වෙහෙර

(ii) දැදිගම කොටවෙහෙර

(iii) මාළිගාවිල දාගැබ

(iv) මිරිසවැටි දාගැබ

(12) තෝපා වැව සහ දඹුලු වැව ඒකාබද්ධ කිරීමෙන් නිර්මාණය කර ඇත්තේ කුමන් වැව ද?

(i) පරාක්‍රම සමුද්‍රය

(ii) තිසා වැව

(iii) හුරුළු වැව

(iv) කන්තලේ වැව

(13) මහා විජයබාහු රජතුමා පිළිබඳව තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රයක් වන්නේ,

(i) ගල්පොත සෙල්ලිපිය

(ii) අඹගමුව සෙල්ලිපිය

(iii) සංගමු විහාර සෙල්ලිපිය

(iv) දෙවනගල සෙල්ලිපිය

(14) ලෝක සංස්කෘතික උරුමයක් ලෙස යුනෙස්කෝ සංවිධානය නම් කර ඇති මොහෙන්ජදාරෝ නගරය වර්තමානයේ අයත් රට කුමක් ද?

(i) ඉරාකය (ii) චීනය (iii) පකිස්ථානය (iv) ජපානය

(15) වෙස් මුහුණු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියට පත් දකුණු පළාතට අයත් නගරයකි.

(i) අම්බලන්ගොඩ (ii) කතරගම (iii) කොළඹ (iv) හික්කඩුව

(16) පැරණි හින්දු පොත්පත්වල ''ජාත කර්ම'' යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

(i) උපතේ දී සිදු කළ සිරිත් විරිත්

(ii) අධ්‍යාපනය ඇරඹීම

(iii) කන් විදීම

(iv) නම් තැබීම

(17) සීගිරියේ ජල තාක්ෂණික නිපුණතාවය පෙන්වන අතිවිශිෂ්ට නිර්මාණය කුමක් ද?

(i) ජල ටැංකි (ii) ජල මල් (iii) පොකුණු (iv) දිය අගල්

(18) *IV* වන උදය රජුගේ සොරබොර වැව සෙල්ලිපියේ සඳහන් වන්නේ,

(i) වෙළඳාම පිණිස නීතිය (iii) පරිසර නීතිය

(ii) වැවේ ජලය භාවිත කිරීම පිළිබඳ නීතිය (iv) අපරාධ පිළිබඳ නීතිය

(19) යුනෙස්කෝ සංවිධානය විසින් හඳුන්වා දී ඇති අස්පෘශ්‍ය උරුමවලට අයත්වන්නේ මින් කුමක් ද?

(i) චෛත්‍ය, බෝධිසර, ප්‍රතිමාඝර (iii) රංග කලාව, ජනකවි, ජන සංගීතය

(ii) වැව්, ගෘහ නිර්මාණ, චිත්‍ර (iv) කැටයම් කලාව, ප්‍රතිමා කලාව, ගෘහ නිර්මාණ

(20) රුවන්වැලි සෑය අලංකාර කිරීම සඳහා රෝමයෙන් පබළු ගෙන්වා ඇත්තේ කුමන රජු ද?

(i) දුටුගැමුණු රජු (iii) මහසෙන්

(ii) වළගම්බා (iv) භාතිකාභය

## *II* – කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **අනෙකුත් ප්‍රශ්න අතරින් හතරකට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

(1) පහත *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර සම්බන්ධ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A



(i) *a.* *A* පින්තූරයෙන් දැක්වෙන කර්මාන්තය කුමක් ද?

*b.* මෙම කර්මාන්තයේ නියැලුණු ශිල්පීන් හැඳින්වූ නම කුමක්ද?

*c.* මෙහි භාවිත වන උපකරණය කුමක් ද?

*d.* මෙම උපකරණය යොදාගෙන නිපදවන භාණ්ඩයක් නම් කරන්න.

(ල. $2 \times 4 = 8$)

B



(ii) *a.* ඉහත රූප සටහනෙන් දැක්වෙන්නේ කුමක් ද?

*b.* එය භාවිත කරන්නේ කුමන ආර්ථික කටයුත්තක් සඳහා ද?

*c.* ඉහත රූපයේ දක්වා ඇති ස්ථානයේ තැන්පත් කරන්නේ කුමක් ද?

*d.* ඉහත සඳහන් ස්ථානයෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද?

(ල. $2 \times 4 = 8$)

(2)

(i) හේන් හැඳින්වීමට අතීතයේ භාවිත කරන ලද නම් දෙකක් ලියන්න. (ල. 02)

(ii) හේනක් සකස් කිරීමේ දී අනුගමනය කරන පියවර දෙකක් නම් කරන්න. (ල. 04)

(iii) හේන් ගොවියා තම හේන ආරක්ෂා කර ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(3)

(i) අතීතයේ දී ශ්‍රී ලංකාව සමඟ වෙළඳ ගනුදෙනු සිදු කළ රටවල් දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) විදේශීය රටවලින් මෙරටට ගෙන ආ භාණ්ඩ දෙකක් නම් කරන්න. (ල. 04)

(iii) *a.* වෙළඳපල පාලනය පිළිබඳ නීති සඳහන් බදුලු ටැම් ලිපිය පිහිටුවන ලද රජතුමා නම් කරන්න.

*b.* එහි සඳහන් වෙළඳ නීති 3 ක් ලියන්න. (ල. 05)

(4)

(i) අනුරාධපුර යුගයේ පැවති ප්‍රධාන රජ පෙළපත් දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(ii) අනුරාධපුර සමයේ රජකම උරුම වූ ප්‍රධාන ක්‍රම දෙක නම් කරන්න. (ල. 04)

(iii) අතීතයේ දී රජතුමාගෙන් රටවැසියා බලාපොරොත්තු වූ කාර්යයන් දෙකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(5)

(i) රාජ්‍ය පාලන කටයුතුවල දී රජුට සහාය වූ නිලධාරීන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

(ii) අනුරාධපුර යුගයේ සමාජ සුබසාධනය පිළිබඳ විශේෂ උනන්දුවක් දැක්වූ රජවරුන් දෙදෙනෙක් නම් කරන්න. (ල. 04)

(iii) මානවම්ම රජතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(6)

(i) *I* වන විජයබාහු රජතුමා ගැන හැදෑරීමේ දී වැදගත් වන මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) මහා පරාක්‍රමබාහු රජතුමා බුදු සසුනේ දියුණුවට කළ සේවාවන් දෙකක් ලියන්න. (ල. 04)

(iii) මහා පරාක්‍රමබාහු රජතුමා ආර්ථික සංවර්ධනය සඳහා කළ කාර්යයන් දෙකක් ලියා විස්තර කරන්න. (ල. 05)

(7)

(i) අනුරාධපුර යුගයේ ශිලාලිපිවල සඳහන් පහත නිලධාරීන් කවුරුන්දැයි හඳුන්වන්න.

*a.* අශ අදෙක *b.* අති අදෙක (ල. 02)

(ii) පහත සෙල්ලිපිවලින් අනාවරණය වන තොරතුරු කෙටියෙන් ලියන්න.

*a.* සංගමු විහාර ලිපිය *b.* දෙවනගල සෙල්ලිපිය (ල. 04)

(iii) *a.* නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග 3 ක් ලියන්න.

*b.* නිශ්ශංකමල්ල රජතුමා විසින් ඉදිකළ ආගමික ගොඩනැගිලි දෙකක් නම් කරන්න. (ල. 05)